කවි කොළය

දැන් මෙන් නොවෙයි මගෙ පුතේ අපි පුංචි කාලේ
කොන්දොස්තරයි ඩැයිවරයි දෙන්නා ගමේමයි
රුවුලත් කපා තේ එකක් එන තෙක්ම බීලා
උන්නා එදා බස් රතේ පාරේ නවත්තා

කොණ්ඩේ බැඳන් නැමි පනා ඔළුවේ ගසාගත්
රුවුලෙන් පවා කරකැවූ - තේජස් බවක් පෑ
ආරච්චිලයි ගම බලා ගත්තේ එ කල්හි
නෑ දැන් වගේ මිනිමැරුම් හෝ ගෝරි බෝරි

සාමෙල් රබෙල් ජේදිරික් පබ්ලිස් රොසානා
මාටින් බබුන් සිරිබිරිස් හෝ මංගො නෝනා
මේ වාගෙ නම් හොය හොයා දැම්මත් අතීතේ
දැන් මෙන් එදා නොතිබුණේ හඳහන් බැලීමක්

බොම්බයි මොටයි සවිබොරෝ හා විස්කිරිඤ්ඤා
නාරම්බිකුයි ලෑතරයි බුන්දියි මුරුක්කුයි
බුල්ටෝ ටොපියි වී පොරියි පොඩි කාලෙ කෑවේ
පීසා රෝල්, හොට්ඩෝග් අපි දැක්කෙවත් නෑ

කාලා බනිස් ගෙඩියකුයි ලොකු කෝලිකුට්ටු
රස්නෙන් හොඳින් ඉඟුරු දාපු තේ එකක් බී
ගත්තේ එදා සත පහයි නැත්තං හයයි බං
ආතා අපේ කියනවා අපි පුංචි කාලේ

කොංඩොම් කියා ඔය රබර් කොපු දැක්කෙවත් නෑ
දාහත් දෙනෙක් දරු පැටව් වැදුවා සිමෝනා
ලාහෙන් මනින්නට තරම් දරුවන් ලැබේවා
ඒ කාලයේ ඒ වගෙයි පැතුවේ මගුල් දා

දුප්පත් ළමුන් බැනියමයි සරමයි අඳිද්දි
කොල්ලෝ අපේ වැඩි දෙනෙක් ඇන්දෝය ජංගි
පාසැල් ගියා පාවහන් හෝ නෑ සපත්තු
ගල්කුරෙනුයි අපි ලියුවේ ගල් ලැල්ලේ

මව් හා ගොසින් කැළණියේ
පන්සල් පොහෝ දා
විස්කම් අතින් සොයිලියස්
මැන්දිස් මහත්මා
මල්කම් ලතා බිත්තියේ
සිත්තම් කරද්දි
උන්නා බලා මං එදා
පාසැල් වියේ දී

♦ *තලන්ගම ජයසිංහ*
Sri Lanka

10 ඩවුනිං වීදියෙන් ලියුමක්

10 DOWNING STREET
LONDON SW1A 2AA
www.number10.gov.uk

From the Direct Communications Unit — 6 January 2011

Mr Daya Ananda Ranasinghe
Lanka Viththi
P O Box 64678
London
NW3 9LS

Dear Mr Ranasinghe

The Prime Minister has asked me to thank you very much for sending him a copy of Lanka Viththi newspaper.

Mr Cameron really appreciates your kind thought and is most grateful for your support and good wishes.

With warm regards.

Yours sincerely

M Davies

MR M DAVIES

Dear Mr Ranasinghe,

The Prime Minister has asked me to thank you very much for sending him a copy of **Lanka Viththi** newspaper.

Mr Cameron really appreciates your kind thought and is most grateful for your support and good wishes.

With warm regards,
Yours sincerely - Mr M. Davies

පසුගිය නොවැම්බර් මස ලංකාවිත්ති පත්‍රයේ මුල් පිටුව සැර සුණේ බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන් මහතා සිය අළුත උපන් බිළිඳු දියණියට කිරිපොවන පින්තූරයකිනි. ඒ සමග සිංහල කවි දෙකක් ද, එම කවිවල අර්ථය දනවන ඉංග්‍රීසි කවියක් ද අපි එහි පළ කළෙමු. ඒවා කිරි බොන දියණියගේ සිතැහි මතුකරමින්, ඇය තෙපලන ආකාරයෙන් ලියන ලද කවි වෙති. ඒ මෙසේ ය.

ඇකයට රැගෙන දැල්වුණු ආදර — ඇසිනී
රස කිරි පොවන මා දැඩි කරනා — ලෙසිනී
මව මෙන් මා රකින පෙම්බර පිය — තුමනී
පෙර පින් නිසා විය මා නුඹගේ — දියණි

පිළියම් නැති ගැටළු එති ඒ කොතෙක් — වුව
නුඹෙ පියවර අනුව යමි වෙත ලොවක් — නව
දැනුමෙන් හැඩෙන් සරුවී මතු හුඟක් — තව
පෙන්වමි ලොවට මා නුඹෙ දියණියක් — බව

Above is the letter sent to us by No: 10 Downing Street appreciating Lanka Viththi Newspaper

Being fed with your caring glare in the eyes
In the comfort of your lap, just like mum's
I am very fortunate to be your daughter.
Problems and unsolved issues will pile up
Yet I will follow in your footsteps to the future
I will grow-up with more pep, charm and powers
To show the world, I am a daughter of yours !

එම ලංකාවිත්ති කලාපය කියවූ අප පාඨකයෝ බොහෝ දෙනෙකු එම පින්තූරය සහ කවි ගැන ප්‍රසාදය පළ කළ අයුරු අපට මතකය. ඒ නිසාම අපි එම කලාපයේ පිටපතක් කැමරන් මහතාගේ නමට අගමැති කාර්‍යාලයට යැවීමු. අගමැතිවරයා සිය ලේකම්වරයාගේ මාර්ගයෙන් තම කෘතඥතාව පළකරමින් අපට එවූ ලිපිය මේ සමග ඉහළ පළවෙයි.

ලංකාවිත්ති
LANKA VITHTHI
මව්‍ය මෙවැනිසේ ස්වර්ගයට වඩා උසස්වා: Mother and Motherland are nobler than Heaven
FOR FREE CIRCULATION
VOLUME 13 NUMBER 08
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.
NOVEMBER 10, 2010 නොවැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2554 ඉල් මාසය) http://www.lankaheritage.com/lankaviththi/

Prime Minister's Feeding time
අගමැතිතුමා කිරිපොවන වේලාවයි මේ!

මේ වහල් වෙළඳාම නවත්වනු!

♦ සිරිත ජයසුන්දර

To have being fed with your caring glare in eyes
In the comfort of your lap, just like mum's
I am very fortunate to be your daughter.

ඉරිදා - වෙනදා ගංවතුර ගැලුවෙ බංගලාදේශයට විතරයි.
SUN දැන් මුළු ලෝකෙ හැම රටටම ගලනවා වගේ. කිසිම රටක් බේරෙන්නෙ නැති පාටයි. මීට ඉස්සර කවදාවත් ගං වතුර ගලපු නැති සවුදි අරාබියාවත් යටවෙලා. ඕස්ට්‍රේලියා වෙ ගංවතුරට කිඹුල්ලුත් ගෙවල් ඇතුළට ඇවිල්ලා. එහේ මිනිස්සුන්ට එළියටයන්න විදියකුත් නෑ. ගේ ඇතුලෙ ඉන්නත් බෑ. ගස් කපන්නෙ එපා, පරිසරය දූෂණය කරන්න එපා කිව්වට කවුරුවත් ඇහුවෙ නැහැ. ඒ විපාක මුළු මහත් ලෝකෙම විඳින කාලෙ ඇවිල්ලා. ස්වභාවධර්මයට ගැහුවොත් ස්වභාවධර්මය මුළු ලෝකෙටම ගහනවා, හොඳ මිනිහ නරක මිනිහ බලන්නෙ නැතුව. ස්වභාව ධර්මයෙ හැටි එහෙමයි

සඳුදා - හුඟ දෙනෙක් කියනවා 2012 දෙසැම්බර් මාසෙ
MON 22 දා ලෝකෙ විනාස වෙනවයි කියලා මෙක්සිකෝ වෙ මායන්වරු ඉස්සර කියපු අනාවැකියක් තියනවලු. මේ ගං වතුර, භූමිකම්පා, සුළිසුළං එන්න ගත්තෙ ඒ නිසයි කියලයි හිතන්නෙ. ක්‍රිස්තියානි කස්ටිය කියනවා බයිබලයෙත් ලෝක විනාසය ගැන තියනවයි කියලා. මුස්ලිම් අයත් කියනවා කුරානයේ එහෙම තියනවයි කියලා. යුදෙව් කස්ටියත් ඒ අයගෙ ආගමේ විනාසෙ ගැන තියනවලු. දැන් ඒ සේරම පුදුම බයකින් ඉන්නෙ, ජීවත්වෙන්න තව අවුරුද්දකටත් අඩු කාලයක්ය තියෙන්නෙ කියලා. මට මතක්වෙනවා ඔය සේරම 2000 ලබන කොටත් බයේ වෙව්ලපු කට්ටිය. හරියට ජීවත්වුණා නම් බයවෙන්න ඕන නෑ... අපි කොහොමත් මැරෙනව නේ....

කුජදා - ලංකාවෙ දැන් කෙරෙන වැඩ ගැන තලවකැලේ
TUE නැන්දම්මා පෙරේදා එවපු ලියුමෙ විස්තර කරලා තිබුණා. ගිය මාසෙ කෝරලෙන් ගෙන්නපු පොල්ගෙඩි ලක්ෂ විස්සක් ගෙන්නලා තියෙන්නෙ අවසර නැතුවය කියලා ආණ්ඩුවෙ මොකක්ද දෙපාර්තමේන්තුවකින් ඒවා හාබර් එකෙන් එළියට එහෙම ගේන්න එපා කියලා. දැන් ඒ පොල් සේරම කුණු වෙලා. ඒවා විනාස කරන්න යනවලු. රුපියල් කෝටි ගණනක පාඩුවක්. ඒවගේ මහවල් බූත වැඩ දැන් රජයෙන් කෙරෙනවා. නැන්දම්මා කියන්නෙ ඒක ලංකාවෙ පොල් මුදලාලිලා එකතු වෙලා ගහපු දහම් ගැටයක් කියලා. ඒ ගොල්ල මුල ඉඳලම කෝරලෙන් පොල් ගේනවට විරුද්ධ වුණා.

බුදදා - මම අද පත්තරේක කියෙව්වා දැන් එංගලන්තෙ
WED ළමයි රේඩියෝ එකට කන්දීම බොහෝ දුරට අඩු වෙලා නිසා බීබීසී ගුවන් විදුලියෙන් ප්‍රචාරය වුණු ළමා වැඩ සටහන් නවත්තන්න තීරණය කරලා බව. එකට හේතුව හුඟක් ළමයි දැන් ටෙලිවිෂන් එකටයි, ඉන්ටර්-නෙට් එකටයි, එම්පී3 මියුසික් ට්‍රැක් වලටයි හුරුවෙලා තිබීම. ඒක ඇහුවම මට මතක්වුණා, අපේ ළමා කාලේ, හවසට අපි ගුවන්විදුලියෙ ළමාපිටිය අහන්න කොච්චර ආසාවෙන් හිටියද කියලා. අපේ ළමයි දෙන්නත් රේඩියේ එකකට ඇහුම්කන් දෙනවා මම මෑතක දැකලම නෑ. ඒ ගොල්ලොත් සංගීතය කනේ ගහගෙන අහන අය. පුදුම ලෝකෙකට අපි දැන් ඇවිල්ලා තියෙන්නෙ.

බ්‍රහස්පතිදා - තව සතියකින් ක්‍රිකට් වර්ල්ඩ් කප් එකට ලංකාව
THU අළුතින් ක්‍රිකට් පිට්ටනි දෙකක් තුනක් හදලා ලෑස්ති වෙන ප්‍රවෘත්ති අපිට දකින්න ලැබෙනවා. ඒ එක්කම මං පින්තූරයක් දැක්කා තිස්සමහාරාමෙ හාමුදුරුවරු කීප දෙනෙක් පිරිත් කිය කියා ක්‍රිකට් බෝලවල පිරිත් නූල් ඔතනවා. ඒක කාගෙ වුවමනාවට කරනවද මං දන්නෙ නෑ. ක්‍රිකට් පාලක මණ්ඩලෙන් කිව්වද එහෙම දෙයක් කරන්න? පිරිත් බලෙන් පුළුවන්ද හාමුදුරුවනේ වර්ල්ඩ් කප් එක දිනන්න? හාමුදුරුවරු වුනත් ඇයි මෝඩවැඩ කරන්නෙ? ඇයි බුදුදහම හැල්ලු කරන්නෙ? මොකක්ද පිරිතෙයි ක්‍රිකට් බෝලෙයි තියන සම්බන්ධකම? ඔබ වහන්සේලට බොහොම ගෞරවයෙන් යුතුවයි කියන්නෙ, ලෝකෙ හිනස්සන වැඩ කරන්න එපා හාමුදුරුවනේ!

සිකුරාදා - මේ ලෝකෙ කවදාවත් සාමකාමීව තිබිලා නැහැ.
FRI කොහෝ හරි හැමදාම ප්‍රශ්නයක්. දැන් ඊජිප්තුවෙ අවුල් සහ පෙළපාලි ජනාධිපති මුබාරක්ට පිටවෙලා යන්න කියලා. දැනට සිය ගණනක් මැරිලා. මුබාරක් යන පාටක් නෑ. එයා දැන් අවුරුදු 29 ක් එක දිගටම බලයෙ. දාලා යන්න කැමති නෑ. කොච්චර හොඳ කෙනෙක් වුනත් කාලයක්දි එපා වෙනවා. නායකයො දැනගන්න ඕන සුදුසු කාලෙ ආවම අයින්වෙන්න. ඒත් දේශපාලකයෙකුට ඒ මොළය එන්නෙ කලාතුරකින්. බලය කියන්නෙ වස්තුව වගේ තමයි ලැබුණු කෙනා අතහරින්නෙ නෑ. ගියත් පුතා හරි දුව හරි එතන තියලා යන්නයි වෑයම. මේවා අපේ රටවල් වලටත් හොඳ පාඩම්!

සෙනසුරාදා - රන්ජනී අද උදේ අපේ ගෙදර ආවා. එයා හැම
SAT සෙනසුරාදාම හවස භාවනා පන්තියකට යනවා. ඒකෙන් එයාට හිතට හුඟක් සහනයක් ඇවිත්ය කියලා කිව්වා. ඒක කොච්චර හොඳ දෙයක් කියලා මමත් හිතුවෙ. අදත් භාවනාවට යනවද ඇහුවම කිව්වා නැහැ අද වැලන්ටයින් ඩාන්ස් එකකට හැමර්ස්මිත් යනවලු. කටට වචන ආවත් මම මුකුත් කිව්වෙ නැහැ.